# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**

**2014 අප්‍රේල්/මැයි/ජූනි**

**සමාජවිද්‍යා පීඨය**

**දේශපාලන විද්‍යාව POLS E 3025**

**රාජ්‍ය පරිපාලනය සහ විමධ්‍යගතකරණය**

**<u>ප්‍රශ්න පහකට (05) කට පමණක් පිළිතුරු සපයන්න</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි** **කාලය : පැය 03 යි**

---

01. රාජ්‍ය පරිපාලනය නිර්වචනය කර එහි විෂය ක්ෂේත්‍රය පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

02. පරිපාලනය අධ්‍යයනය සම්බන්ධයෙන් දායකත්වය දැක් වූ පහත සඳහන් ඕනෑම චින්තකයකුගෙන් එක් අයෙකු පිළිබඳ රචනාවක් ලියන්න.

    i. හෙන්රි ෆෙයෝල්
    ii. ෆෙඩ්රික් ටේලර්

03. i. විමධ්‍යගතකරණය නිර්වචනය කරන්න.
    ii. විමධ්‍යගකරණය විධි පිළිබඳ විමසීමක් කරන්න.

04. සම්ප්‍රදායික රාජ්‍ය පරිපාලනය සහ සංවර්ධන පරිපාලනය එකිනෙකින් වෙනස් වන්නේ කෙසේද ?

05. "සමස්ත ඉන්දීය සේවාව ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවටත්, ප්‍රාන්ත ආණ්ඩුවලටත් පොදු වේ. එම සේවාවන්හි නියුක්ත වූවන් ඕනෑම අවස්ථාවක මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර හුවමාරු වීමේ හැකියාවෙන් යුක්ත වන අතර ඔවුන් බඳවා ගැනීම හා පාලනය කිරීම සිදු වන්නේ මධ්‍යම ආණ්ඩුව මගින් ය" මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

06. රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය යටතේ පහත සඳහන් මාතෘකා දෙක පිළිබඳ සාකච්ඡා කරන්න.

    i. බලතල සහ කාර්යභාරය
    ii. මධ්‍යම ආණ්ඩුව සමග ඇති සම්බන්ධතාව

08. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන ක්‍රමය කෙරෙහි පහත දැක්වෙන ව්‍යවස්ථාමය විධිවිධාන බලපැවැත්වෙන ආකාරය පරීක්ෂා කරන්න.

    i. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා)
    ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

09. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

    i. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය.
    ii. ප්‍රංශයේ රාජ්‍ය කවුන්සිලය.
    iii. බ්‍රිතාන්‍යයේ නෝර්ත් කෝට් ට්‍රැවලියන් යෝජනා.
    iV. අවධිමත් සංවිධානය
    V. මැක්ස් වෙබර්ගේ නිලබලක්‍රමය.

******************************